මැතිවරණ වේදිකාවේ බයිට් වෙන ලසන්ත ඝාතනය

ශ්‍රීලාල් සෙනෙවිරත්න

සන්ඩේ ලීඩර් පුරෝහාමි කර්තෘ, මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග ඝාතනය ජනතා අවධානයට යොමු කෙරෙන සිදුවීම් තැවතත් පෙළ ගැසෙන්නට පටන්ගෙන තිබේ. මෙවර එය ආරම්භ වන්නේ ජෙනරල් ෆොන්සේකාගේ මාධ්‍ය සම්බන්ධීකාරකයකු ලෙස කටයුතු කළ සංජීව සමරසිංහ සති කීපයකට පෙරදී මරදානේදී පවත්වන ලද ප්‍රවෘත්ති සාකච්ඡාවකිනි. ජෙනරල් ෆොන්සේකාට අවාසි සහගත කරුණු ඉදිරිපත් කෙරුණු එම මාධ්‍ය හමුවේදී ලසන්ත ඝාතනය පිළිබඳ අදහස් දක්වමින් සංජීව සමරසිංහ මෙසේ පැවසුවේය.

''මම තමයි සරත් ෆොන්සේකා මහතා සමග වැඩිම කාලයක් ළඟින්ම ගිටිය කෙනා. එක් අවස්ථාවක මම ඔහුගෙන් ලසන්ත ඝාතනය ගැන විමසුවා. එවිට ඔහු කිව්වා ඔහුගේ ස්ථාවරය සීමාව ඉක්මවා යන කිසිවෙකුට තවත් කාලයක් ලබා නොදිය යුතු බව කියලා''

මේ ප්‍රකාශය අවධාරණය කරමින් සංජීව සමරසිංහ මාධ්‍ය හමුවේ කළ අදහස් දැක්වීම් ලසන්ත ඝාතනයට ජෙනරල් ෆොන්සේකාගේ සම්බන්ධයක් තිබෙන බවට ඉඟි කළේය. පසුව එම ප්‍රකාශ පදනම් කරගනිමින් ලසන්තගේ අයිතිවාසිකම් වෙනුවෙන් වෙනුවෙන් ගල්කිස්ස අධිකරණයට කරුණු ඉදිරිපත් කළ නීතිඥ පිරිසක් කියා සිටියේ මේ ප්‍රකාශ ඔස්සේ පරීක්ෂණ සිදුකර ඝාතකයන් සොයාගැනීමට අධිකරණ නියෝගයක් ලබාදෙන ලෙසය.

ලසන්ත ඝාතනයෙන් පස් වසරක් ඉක්ම ගිය තැන මේ සියල්ල සිදුවන්නේ බස්නාහිර සහ දකුණ පළාත්වල පළාත් සභා මැතිවරණ සටන උණුසුම් මුහුණුවරක් ගනිමින් පවතින පසුබිමකය. මීට පෙරත් පූර්ව මැතිවරණ සමයේදී ලසන්ත ඝාතනය ජනතා අවධානයට ලක්කෙරෙමින් මෙවැනි කරුණු කාරණා මතුවුවද ඒ කිසිවක් සම්බන්ධයෙන් පොලිස් පරීක්ෂණ සිදුවීමක් හෝ ඝාතකයන් කොටුකර ගැනීමක් සිදු නොවිය.

ලසන්ත ඝාතනය කෙරුණේ ඊළාම් යුද්ධයේ උච්චතම කාල වකවානුවකය. ඒ වන විට මුළු රටම යුද්ධයේ භීෂණයෙන් වෙළාගෙන තිබිණ. ත්‍රස්තවාදී ප්‍රහාරයක් එල්ල විය හැකි යැයි සිතෙන සෑම ස්ථානයකටම උපරිම ආරක්ෂාවක් සඳහා තිබිණ. දේශපාලන, ආර්ථික මර්මස්ථාන ඇති ප්‍රදේශ අධි ආරක්ෂිත කලාප ලෙස ප්‍රකාශයට පත්කර තිබිණ. මාර්ග බාධක සහ පරීක්ෂා කිරීම් කොතෙක් විද යත් එවක ගමනක් යාම බොහෙවින් වෙහෙසකර සහ කාලය කාදමන කටයුත්තක් බවට පත්ව තිබිණ. පැවැති දැඩි ආරක්ෂක විධි විධාන හමුවේ එල්ටීටීයට පවා දකුණේ ත්‍රස්තවාදී ප්‍රහාර ක්‍රියාත්මක කිරීම දුෂ්කරව තිබිණ. සැළසුම් කරන ලද ත්‍රස්තවාදී ප්‍රහාර විශාල ප්‍රමාණයක් ව්‍යර්ථ කිරීමටද ආරක්ෂක අංශ සමත්විය.

මෙවැනි ඉහළ ආරක්ෂක තත්ත්වයක් පවතින අවස්ථාවක ලසන්ත ඝාතනය වන්නේ රත්මලාන ගුවන් හමුදා කඳවුර ආසන්නයේ ජනාකීර්ණ වීදියකදී මහ දවාලේය. ලසන්ත ඝාතනයට පැමිණි ප්‍රහාරක යතුරු පැදිකරුවන් ප්‍රහාරයෙන් පසු පලායන්නේ ගුවන් හමුදා කඳවුරු ආරක්ෂක කලාපය දෙසටය. විනාඩි කීපයක් තුළ අතුරුදහන් වන මේ යතුරුපැදි ප්‍රහාරකයන් පිළිබඳ කිසිම තොරතුරක් සොයාගන්නට ලසන්ත ඝාතනය පිළිබඳ පරීක්ෂණ පවත්වන පොලිසියට හැකියාවක් ලැබෙන්නේ නැත.

ඒ අනුව ලසන්ත ඝාතනයට ආරක්ෂක අංශවල සම්බන්ධයෙක් ඇති බවට මතුවන සාධාරණ සැකය බැහැර කළ නොහැකිය. ප්‍රහාරකයන්ගේ සහ ප්‍රහාරයේ ස්වභාවය අනුව එය මනාව පුහුණු කරන ලද යතුරුපැදි ප්‍රහාරක කණ්ඩායමක ප්‍රහාරයක් බව පෙනීයන බැවින් එම සැකය තවදුරටත් වර්ධනය වේ. කොළඹ ආශ්‍රිතව විවිධ සංවිධානාත්මක අපරාධ කළිලි සිදුකරන ඝාතන වාර්තා වුවද ඒ කිසිවක් මේ ප්‍රහාරය ආසන්නයටවත් ගත නොහැකි තරම් ප්‍රාථමික ක්‍රමවේද යොදාගන්නා ලද ප්‍රහාරයන් විය. ලසන්ත ඝාතනයෙන් පසු ඒ පිළිබඳ සැකය සෘජුවම ආරක්ෂක හමුදා වෙත යොමුවන්නේ ඒ හේතුවෙන් පමණක්ම නොවේ. ඒ වන විට ආරක්ෂක අංශවලට අණදෙන ප්‍රධාන චරිත තුනක් ලසන්ත හා වෛරී ආකල්පයෙන් කටයුතු කළ බැවිනි.

ලසන්ත ඝාතනය ආරක්ෂක අංශ ප්‍රහාරකයන් යොදාගෙන සිදුකළේ නම් එයට අණදුන් පුද්ගලයා කවුද? යන්න ඊළඟට මාධ්‍ය සමාජයේ කතාබහට ලක්වූ කාරණය විය. ඒ වන විට ආරක්ෂක අංශ ප්‍රහාරකයන් යොදාගෙන මෙවැනි ඝාතනයක් සිදුකරීමට බලය සතුවූයේ ඉහත කී පුද්ගලයන් තිදෙනාටය. ඔවුහු නම් යුද හමුදාපතිවරයා, ආරක්ෂක ලේකම්වරයා සහ ජනාධිපතිවරයාය. විශේෂ පුහුණුව ලැබූ කුඩා ප්‍රහාරක කණ්ඩායම් ප්‍රධාන වශයෙන් ක්‍රියාත්මක වූයේ මොවුන් යටතේය. ඔවුන්ගේ ආරක්ෂාව වෙනුවෙන්ද එම ප්‍රහාරක කණ්ඩායම් සහ යතුරු පැදිකරුවන් යොදාගැනීම එවක සිදුවිය.

එවක යුද හමුදාපති වූයේ ජෙනරල් ෆොන්සේකාය. හමුදාපතිවරයාගේ ඝෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන විශේෂ ප්‍රහාරක කණ්ඩායම් ද ස්ථාපිත කර තිබුණි. (විවිධ අවස්ථාවල ඒ පිළිබඳ කරුණු අනාවරණය විය)

ඒ වන විට යුද හමුදාවේ දූෂණ හෙළිදරව් කරමින් විශේෂාංග ලිපි කීපයක් සන්ඩේ ලීඩර් පත්‍රයේ පළවීම හේතුවෙන් හමුදාපතිවරයා සිටියේ ලසන්ත සමග අමනාපවය. යුද්ධයේ උච්ඡතම අවස්ථාවක හමුදාව පිළිබඳ මෙවැනි වාර්තා පලකිරීමෙන් හමුදාවේ ''මෙරාල් එක'' බහින බවත් එය දේශ ද්‍රෝහී ක්‍රියාවක් බවත් හමුදාපතිවරයා අවස්ථා කීපයකදීම මාධ්‍යයටද කියා තිබිණ. එබැවින් මෙය වහාම නවතා දැමිය යුතු තත්ත්වයක්ය යන්න ඔහුගේ ස්ථාවරය ලෙස ප්‍රකාශයට පත්ව තිබිණි.
හමුදාපතිවරයා මාධ්‍යයට කර තිබූ මෙවැනි ප්‍රකාශවලට ප්‍රතිචාර දක්වමින් ලසන්ත විමසා සිටියේ ''මෙරාල් එක'' බහින්නේ හමුදාව තුළ සිදුවන දූෂණ අනාවරණය කිරීම නිසාද නොඑසේ නම් හමුදාව තුළ දූෂණ සිදුවීම නිසාද කියාය. හමුදාපතිවරයා ස්වභාවයෙන්ම මෙවැනි විවාද නොතුවසන අයෙකු වුවා පමණක් නොව ඒ වනවිට ඔහු සතුව තිබූ විශාල බලය හේතුවෙන් එලෙස ඉවසීමේ අවශ්‍යතාවයක් ද නොතිබුණි.

ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ එවක සිටියේද ලසන්ත සමග බලවත් සේ උරණවය. ඊට ප්‍රධාන හේතුව වී තිබුණේ ගුවන් හමුදාවට ප්‍රහාරක යානා මිලදී ගැනීමේදී සිදුවූ බව කියන මහා පරිමාන දූෂණයක් ලසන්ත සිය පුවත්පත මගින් හෙළිදරව් කර තිබීමය. එය මහත් ආන්දෝලනාත්මක හෙළිදරව්වක් වූ අතර එය අසත්‍ය වාර්තාවක් බව කියමින් ඊට එරෙහිව ආරක්ෂක ලේකම්වරයා ගල්කස්ස අධිකරණයේ නඩුවක් පවරනු ලැබුවේය. මේ නඩුවේදී ගුවන් හමුදා යානා මිලදී ගැනීමේදී වංචාවක් සිදුවී ඇති බව සාක්ෂි සහිතව තහවුරු කිරීමට ලසන්තට සිදුව තිබිණ. එලෙස තහවුරු කළ හොත් ආරක්ෂක ලේකම්වරයාගේ නඩුව නිශ්ඵල වනවා පමණක් නොව ඔහු ලෝකය හමුවේ මහත් අවමානයකට පත්වීමද නොවැළැක්විය හැකි විය. ලසන්තට සිය වාර්තාව සාක්ෂි මගින් තහවුරු කිරීමට නොහැකි වුවහොත් ආරක්ෂක ලේකම්වරයාට අපහාස කිරීම සහ රටට ද්‍රෝහිවීමේ චෝදනා මත සුවිශාල වන්දියක් ගෙවීමට සිදුවීමද නොවැළැක්විය හැකි විය.

මගේ මතකයේ හැටියට ලසන්තගේ මාධ්‍ය ජීවිතයේදී මෙවැනි ගැටළුවකට මුහුණ දුන් පළමු අවස්ථාව මෙය විය. ලසන්ත මහා පරිමාණ දූෂණ සිය ගණනින් හෙළිකරමින් වාර්තා පලකර තිබුණද කිසිම විටක ඒ වාර්තා අසත්‍ය යැයි කියමින් කිසියම් හෝ පාර්ශ්වයක් ලසන්තට හෝ ඔහුගේ පුවත්පතට එරෙහිව අධිකරණයට ගොස් තිබුණේ නැත. යම් හෙයකින් එවැනි නඩුවක් පැවරුණි නම් තමන්ගේ වාර්තාවේ සත්‍යතාව ඔප්පු කිරීමට අවශ්‍ය තරම් සාක්ෂි ඇතුළත් ලිපිගොනු සෑම විටකම ලසන්ත ලඟ තිබුණේය. එවැනි රහසිගත ලිපිගොනු තමන්ගේ මේසයට ගෙන්වාගැනීමේ ක්‍රමවේදයක් ලසන්ත සතුව තිබුණු අතර ඔහු අනාවරණයන් සිදු කළේ ඒ සාක්ෂි ගොනු තමන් අත තබාගෙනය.

ලසන්තගේ මාධ්‍ය භාවිතයේ එකී ස්වභාවය අනුව ගුවන් හමුදා යානා මිලදී ගැනීමට අදාළව සිදුව ඇතැයි කී වංචාවට අදාළ වැදගත් තොරතුරු සහිත ලිපි ගොනුවක් ඔහු අත තිබෙන්නට ඇතැයි විශ්වාස කළ හැකිය. ලසන්ත ඝාතනය කෙරෙන්නේ ආරක්ෂක ලේකම්වරයා ඔහුට එරෙහිව පැවරූ නඩුව විභාගයට ගැනීමට දිනකට හෝ දෙදිනකට පෙර දිනය. එබැවින් ලසන්ත ගුවන් හමුදා යානා වංචාව හෙළිදරව් කළේ කවර තොරතුරු මතද යන්න දැනගැනීමට කිසිවෙකුටත් නොහැකි විය.
ලසන්ත ඝාතනයෙන් පසු රූපවාහිනී සාකච්ඡාවකට සහභාගි වූ ආරක්ෂක ලේකම්වරයා ලසන්ත ගැරඩියෙකුට සමාන කරමින් ප්‍රකාශ කළේ මේ අවස්ථාවේදී ගැරඩි මැරීමට වඩා වැදගත් කාර්යයක් හමුදාවට පැවරී ඇති බවය. එහිදී ආරක්ෂක ලේකම්වරයා අදහස් දැක්වූ ආවේගශීලි විලාශය හමුවේ කතාව වහාම වෙනත් මාතෘකාවක් වෙත යොමු කිරීමට රූපවාහිනී මාධ්‍යවේදියා කටයුතු කළේය.

ලසන්තගේ අවමංගල්‍ය කටයුතු සිදුවූදා විශාල විරෝධතා ව්‍යාපාරයක් පැවැත්විණි. අවමඟුල් පෙරහැර විරෝධතා පෙළපාලියක් බවට පත්විය. එහිදී විරෝධතාකරුවන් අත වූ ඇතැම් පුවරුවල ''ඝාතකයා සාධකයා'' යනුවෙන් සඳහන් කර තිබුණි. සාධකයා යන්නෙන් අදහස් කළේ ජනාධිපතිවරයා බව පැහැදිය. මින් ප්‍රකාශ වූයේ ලසන්ත ඝාතනයට ජනාධිපතිවරයාගේ සම්බන්ධයක් ඇති බවය. ජනාධිපතිවරයාගේ පවුලේ සාමාජිකයන් අපහසුතාවට පත්වන ආකාරයේ වාර්තා සන්ඩේ ලීඩර් පුවත්පතේ පලවී තිබීම සහ ඒ පිළිබඳ උරණ වී ජනාධිපතිවරයා ලසන්තට මරණ තර්ජණ කළ බවට ලසන්ත පොලිස්පතිවරයාට පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබීම ද ඊට හේතුවිය. එහෙත් ලසන්ත ඝාතනය සිදු වන කාලය වන විට ලසන්ත සහ ජනාධිපතිවරයා අතර එතෙක් පැවැති ගැටුම්කාරී තත්ත්වය පහව ගොස් දෙදෙනා අතර පරණ ගීතවත්කම් අලුත්වන තත්ත්වයක් පැවැති බවට කරුණු පසුව හෙළිදරව් විය.

ලසන්ත ඝාතනය සම්බන්ධයෙන් පොලිසියද අපරාධ පරීක්ෂණ දෙපාර්ථමේන්තුවද පරීක්ෂණ පවත්වා අධිකරණයට කරුණු වාර්තා කළද වසර ගණනාවක් ගතවන තෙක් ඝාතකයන් ගැන එකම වැදගත් තොරතුරක් හෝ මේ දෙපාර්ශ්වයට ලැබී තිබුණේ නැත. ලංකාවේ පොලිසියේ හැසිරීම දෙස බැලූ විට පෙනී යන්නේ කවර මිටිටමේ අපරාධයක් වුවද සිදුවී ඉතා කෙටි කාලයක් ඇතුළත අපරාධකරුවන් සොයාගැනීමට පොලිසිය දක්ෂ බවය. එහෙත් ඒ අපරාධයට දේපාලන සම්බන්ධයක් නොමැති විටය.

ජෙනරල් ෆොන්සේකා තනතුරු අතහැර දේශපාලනයට පිවිස විපක්ෂයේ පොදු අපේක්ෂකයා ලෙස ජනාධිපතිවරණයට තරග කරන්නේ ලසන්ත ඝාතනය නොවිසඳුනු අභිරහසක්ව තිබියදීය. ජෙනරල් ෆොන්සේකා ප්‍රථම වරට ලසන්ත ඝාතනය ගැන කතා කරන්නේ මැතිවරණ සටන අරඹමිනි. ඔහු කියා සිටියේ ලසන්ත ඝාතනයට තමන්ගේ සම්බන්ධයක් නොමැති බවය.

ජෙනරල් දේශපාලනයට පිවිසීමෙන් පසු ඔහුට එරෙහිව ආණ්ඩුව ගෙන ගිය සාහසික ක්‍රියා පිළිවෙත කාටත් නොරහසකි. යොදාගත හැකි සියළු අවි යොදාගනිමින් ආණ්ඩුව ජෙනරල්ට පහර පිට පහර දී අවසානයේ අත්අඩංගුවට ගෙන සිරගත කළේය. ආණ්ඩු බලය අත්තනෝමතිකව යොදාගෙන සිදුකළ ඒ මර්ධනකාරී වැඩපිළිවෙළ සාදාරණීකරණය කරන්නට ආණ්ඩුවට බලවත් හේතු පාධයක් තිබුණේ නැත. ජෙනරල් අත්අඩංගුවට ගැනීමෙන් මාස දෙකකට පමණ පසු ඔහුට ඉදිරිපත් කරන ලද චෝදනා වූයේද රාජ්‍ය විරෝධීවීම සහ ටෙන්ඩර් පටිපාටියට පිටින් හමුදාවට උපකරණ මිලදී ගැනීම වැනි දුබල චෝදනාය. ලසන්ත ඝාතනයට ජෙනරල්ගේ සම්බන්ධයක් තිබුණේ නම් එය මේ අවස්ථාවේදී ඔහුට එරෙහිව භාවිත කරන්නට ආණ්ඩුව සතු බලවත් අවියක් වන්නේය. එවැනි අවියක් තිබුණේ නම් එය පාවිච්චි කිරීමෙන් වැළැකී සිටින්නට ආණ්ඩුවට කිසිදු අවශ්‍යතාවක් අතිවිය නොහැකිය. එහෙත් එවැන්නක් සිදු නොවීය.
දැන් පළාත් සභා මැතිවරණ සටන යන අතරේ ලසන්ත ඝාතනයට නැවත වරක් ජෙනරාල් ඈදාගන්නට වෙර දැරෙමින් තිබේ. මීට පෙර මැතිවරණ කීපයදීම මේ කටයුත්ත මේ ආකාරයට සිදුවිය. එහෙත් මැතිවරණය නිමාවීමෙන් පසු ලසන්ත ඝාතනය ගැන පවතින උණුසුම් කතාබහද අවසන් වූවා මිස අන් යමක් සිදුවූයේ නැත.